# පැරිසියේ ලාංකික චිත්‍ර ප්‍රදර්ශනයක්

**ප්‍ර**ංශයේ ශ්‍රීලංකා තානාපති කාර්‍යාලයේ හා පැරිසියේ මෝනා බිස්මාර්ක් පදනමේ එකතුවෙන් ශ්‍රීලාංකික සිත්තරුන්ගේ චිත්‍ර ප්‍රදර්ශණයක් පසුගිය දා පැරිසියේදී විවෘත විය. ලංකාවේ අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ ශ්‍රීලංකා ලලිත කලා විශ්වවිද්‍යාලයේ කුලපති සරත් අමුණුගම මහතා ද මෙහි ආරම්භක උත්සවයට පැමිණ සිටියහ. පැරිස් නගරයේ නිව්යෝර්ක් වීදියේ මෝනා බිස්මාර්ක් පදනම් කලාගාරයේදී මෙම චිත්‍ර ප්‍රදර්ශනය ජූලි මස 12 වෙනි දින දක්වා විවෘතව පවතී.

පැරිසියේ පැවැත්වෙන බොහෝ උත්සව අතර මෙම චිත්‍ර ප්‍රදර්ශනය බොහෝ දෙනාගේ විශේෂ අවධානයට මෙන්ම ප්‍රශංසාවට ලක්වූ බව සඳහන් කළ යුතුය. චිත්‍ර 60 කින් සමන්විත වූ මෙය ශ්‍රීලංකාවේ හැට වෙනි නිදහස් උළෙල සැමරීම උදෙසා පැවැත්වීම ද විශේෂත්වයකි. මෙම ප්‍රදර්ශනයේ සාර්ථකත්වයට අවශ්‍ය කටයුතු සියල්ල මනාව ඉටු කළ ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපතිනිය වන චිත්‍රාංගනී වාගීශ්වර මහත්මිය ඇතුළු එම කාර්‍ය මණ්ඩලයටද, මෝනා බිස්මාර්ක් පදනමට ද, සරත් අමුණුගම මහතාට ද අපගේ හෘදයාංගම ස්තුතිය හිමිවිය යුතු ය.

ශ්‍රීලංකාවේ ප්‍රවීන චිත්‍ර ශිල්පීන් වන ජයසිරි සේමගේ, සීවලී ඉලංගසිංහ, තිලක් අබේසිංහ, පියරත්න හේවාබැට්ටගේ, සෝමබන්දු විද්‍යාපති, මහින්ද අබේසේකර ආදීන්ගේ මෙන්ම ආධුනික සිත්තරුන්ගේද මන බඳින සිත්තම් වලින් ප්‍රදර්ශනය අලංකාර විය. මෙම ප්‍රදර්ශනය නැරඹීමෙන් අනතුරුව මසිතේ පිළිපන් උත්තේජනය හා සතුටද මත මට හැඟුණ අදහස් කීපයක් මෙහි සටහන් කරමි.

ලාංකික චිත්‍රශිල්පියෙකුට, ලේඛකයෙකුට හෝ සිනමාකරුවෙකුට ජාත්‍යන්තර තලයට ඇතුල්වීම පහසු කටයුත්තක් නොවේ. එහෙත් ඒ අතරින් චිත්‍ර ශිල්පියෙකුට ඊට ඇති ඉඩ හසර වැඩිය. රට රටවල් අනුව එක් එක් ජාතීන්ගේ ගති ලක්ෂණයන්හි බොහෝ වෙනස්කම් ඇතද, චිත්‍රයක රසවිඳීමට ඒවා බල නොපායි. අවශ්‍ය වන්නේ කලාත්මක දෑසක් හා මනසක් පමණි. පොතක් හෝ චිත්‍රපටයක් මෙන් නොව චිත්‍රය භාෂා මාධ්‍යයෙන් තොරවීමද එහ රසය විඳගැන්මට ඇති හැකියාව තීව්‍රකරයි. ඒ අනුව බලන කල සිත්තරෙකුට තම තෙලිතුඩ හරහා ජාත්‍යන්තර කීර්තියට පත්වීමට ඇති ඉඩ කඩ වැඩියයි සිතේ.

ප්‍රමුඛ කලා මාධ්‍යයන් ලෙස සලකන ලේඛන කලාව හා සිනමාව අද ජාත්‍යන්තර තලයට රැගෙන යෑමේදී බොහෝ ගැටළුවලට ලක්වන බව පෙනේ. සිංහළ සාහිත්‍යයෙන් ලෝක සාහිත්‍යයට ගොස් ඇත්තේ සියයට දශම ගණනකටත් අඩු ප්‍රමාණයක් බව මහාචාර්‍ය සුනිල් ආරියරත්න ලන්ඩනයේ පැවති සාහිත්‍ය උත්සවයකදී ප්‍රකාශකර තිබිණ. දැන් දැන් අපේ ලේඛකයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් නවකතාකරණයට පිවිසෙන බවක් ද දක්නට ලැබේ.

ඒ පිළිබඳ පළවූ විවිධ අදහස් අතර ගුණදාස අමරසේකර මහතා කියා තිබුණේ ලේඛකයන් සාහිත්‍යකරණයේ යෙදිය යුත්තේ තම මව්බසින් තමාගේ රටේ ජීවත් වන පාඨකයන් සඳහා බව ය. ඉංග්‍රීසි බසින් නවකතා ලිවීම කෙසේ වෙතත් සිංහළ කෘතීන් ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම වැරැද්දක් නැතැයි මට සිතේ. අඩුතරමින් ඒවා ඉංග්‍රීසි කතාකරන පාඨකයින් අතරට යන බැවිනි.



ප්‍රංශය යනු ඉංග්‍රීසියට නොව ප්‍රංශ බසට මුල්තැන දෙන රටකි. එහෙත් ජාත්‍යන්තර භාෂාව ලෙස ඉංග්‍රීසි බස භාවිතයට තහනමක් ද නැත. උදාහරණයක් ලෙස මෙම චිත්‍ර ප්‍රදර්ශනය විවෘත වූ දින උත්සවයේ සියළු කටයුතු සිදුවුණේ ඉංග්‍රීසියෙනි. ප්‍රංශ සංස්කෘතියට අනුව සිංහළ පොතක් ප්‍රංශ බසට පරිවර්තනය කිරීමේදී ප්‍රංශ සමාජය එය කෙසේ පිළිගනීද යන්න දෙවරක් සිතා බැලිය යුතු කරුණකි. නමුත් පුදුමය නම් අප රටේ ඕනෑම දේශයකින් එන පොතක පරිවර්තනයක් ආදරයෙන් වැළඳගන්නා ස්වභාවයක් ඇත. ඕනෑම නුහුරු ආගන්තුක රටක සමාජයට අනුගත වී ඒ රටේ පොතක් රසවිඳින්නට අපේ පාඨකයිනට පුළුවන. එහෙත් ප්‍රංශ ජාතිකයෝ එසේ නොවෙති. වෙනත් සංස්කෘතියකින් එන කෘතියක් ගැන හාරා අවුස්සා ප්‍රශන කරති.

සිංහළ චිත්‍රපට ගැන කතාකිරීමේදී මෙයට වඩා තරමක් සතුටු විය හැකිය. මෑත කාලයේ අපේ තරුණ සිනමාකරුවෙකු වන විමුක්ති ජයසුන්දර ප්‍රංශයේ කාන් චිත්‍රපට උළෙල ද ජයගෙන තිබිණ. එහෙත් සාමාන්‍ය ප්‍රංශ ප්‍රේක්ෂකයන්ගේ තත්වය එසේ නොවේ. ප්‍රංශ බසින් සිරස්තල යොදා පෙන්වූ සිංහළ සිනමාවේ අද්විතීය ලකුණක් ලෙස සැලකෙන

**නිධානය** චිත්‍රපටය නැරඹූ බොහෝ ප්‍රංශ ජාතිකයන්ට අවසානයේ ප්‍රධාන නිළිය පිහියකින් ඇන මරා දැම්මේ ඇයිද යන්න ගැටළුවක් විය. අප රටේ මන්ත්‍ර ගුරුකම්, බිලිපූජා, පුස්කොල පොත්, නිදන්හැරීම් ආදිය ගැන කිසිවක් නොදන්නා ඔවුන් එසේ සිතීම අසාධාරණ ද නොවේ. එහෙත් **තනි තවුවෙන් පියාඹන්න** නම් ලිංගික තේමාවක් රැගත් චිත්‍රපටය ඔවුන් වහා තෙරුම්ගෙන තිබිණ.

මෙවැනි තත්වයන් යටතේ ශ්‍රීලාංකික කලා ක්ෂෙත්‍රයන්හි යම් පුනර්ජීවනයක් ප්‍රංශය තුළ ව්‍යාප්ත කිරීමට වෙර දරන ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපතිතුමියට අපගේ කෘතඥ තාව හිමිවිය යුතුය. මා එසේ සඳහන් කරන්නේ දැන් දැන් ශ්‍රීලාංකික යන් විසින් පවත්වනු ලබන නැටුම් ගැයුම් ආදී බොහෝ උත්සව අතර මෙම ලාංකික චිත්‍ර ප්‍රදර්ශනයට ජාත්‍යන්තර මට්ටමින් සැලකිය යුතු ස්ථානයක් මෙන්ම කාලීන වැදගත්කමක් ද හිමිවන බැවිනි.

♦ **පද්මා කුරුප්පු** Paris France

# ජනාධිපති ඝාතනය කරන්නට කොටි යෙදූ අළුත්ම උපක්‍රමය හෙළිවේ

**ඒ්** මෙසේ ය. ජනාධිපති ආරක්ෂක ඒකකයේ නිලධාරියෙකු සමග කොටි තරුණියක් යහළු වේ. ඉක්මනින් ඔව්හු පෙම්වතුන් වෙති. ඊළඟට ඔව්හු විවාහවන්නට කටයුතු යොදති. තරුණිය නිලධාරියා ලවා විවාහයට අත්සන් කරන්නට ජනාධිපතිතුමාට ආරාධනා කරයි. තමාගේ නිලධාරියෙක් නිසා ජනාධිපතිවරයාද කැමතිවනු ඇත. විවාහය සිදුවන්නේ කොළඹ ලොකු හෝටලයක ය. එදින මංගල ඇඳුමින් සැරසී එන කොටි මනාලියගේ බඩේ බැඳගත් බෝම්බයකි. ඇය එය ජනාධිපතිතුමා ඇතුළු සියළු දෙනා ඉදිරියේ පුපුරවා ගනී.

ජනාධිපති ආරක්ෂක ඒකකයේ එක් නිලධාරියෙක් හිටි හැටියේ අත දිග හැර මුදල් වියදම් කරන්නට පටන්ගෙන ඇත. ඒ මුදල් සිය පෙම්වතිය දෙන බව ඔහු කී විට හමුදා බුද්ධි අංශය ඒ ගැන සුපරීක්ෂාකාරී වීය. පෙම්වතිය දුවිඩ බවත්, ඇය උතුරේ කොටි දෙනක් බවත් පෙනුණේ ඉන් පසුවය. සැලැසුම අනාවරණය වූයේ එහිදීය. තවම පරීක්ෂණ පැවැත්වේ.

# ෆාස්ට් කෑෂ් 2008 ශ්‍රීලංකා ක්‍රිකට් සැණකෙළියේ සම අනුග්‍රාහකයෙකි

## Fastcash to co-sponsor Festival of Cricket 2008

**එ**ක්සත් රාජධානියේ සිට ලොව පුරා මුදල් ගණුදෙනු කරන ප්‍රධාන ජනප්‍රිය ආයතනයක් වන ලන්ඩනයේ ෆාස්ට් කෑෂ් මේ 2008 ලන්ඩනයේ පැවැත්වෙන ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළියේ ප්‍රධාන අනුග්‍රාහකයෙකු ලෙස පත්ව සිටියි. මෙහි අනෙක් අනුග්‍රාහක ලන්ඩනයේ ලංකා බැංකු ශාඛාවයි. මේ සඳහා අවශ්‍ය ලියකියවිලි අත්සන් කර, නිල වශයෙන් එකඟතාවයකට පැමිණීම ක්‍රිකට් සැණකෙළියේ නිලධාරීන් සහ ෆාස්ට් කෑෂ් මුදල් හුවමාරු ආයතනයේ අධිපති මයික් කුක් මහතා අතර පසුගිය මාර්තු 18 වෙනි දින ලන්ඩනයේ එම කාර්‍යාලයේදී සිදුවිය. මේ ෆාස්ට් කෑෂ් ක්‍රිකට් සැණකෙළිය හා සම්බන්ධවන ප්‍රථම වාරය නොවේ. පසුගිය දශකය තුළ ක්‍රිකට් සැණකෙළිය පැවැත් වූ සෑම වාරයකම එය විවිධ අයුරින් ඊට සම්බන්ධ වී ඇත. විශේෂයෙන් 2005 වසරේ ෆාස්ට් කෑෂ් එහි ප්‍රධාන අනුග්‍රාහකයා ද වීය.

2008 ක්‍රිකට් සැණකෙළිය මෙම ජූලි මස 13 වන දින උතුරු ලන්ඩනයේ **Winchmore Hill** ක්‍රිකට් පිටියේ පැවැත්වීමට නියමිතය. වැඩි විස්තර සඳහා මෙම වෙබ් අඩවිය පිරික්සන්න.

**www.festivalofcricket.org.**

Mr Mike Cooke (Left), Chairman and CEO of MCG exchanging contracts with Dr Deutram Thambapillai, President, FOC 2008

From Left to Right: Mr Bryan Costa, Head of IT, MCG; Mr Keith Fernando, Group Sales and Marketing Manager, MCG; Mr Cooke, Dr Thambapillai and Mr Victor Wickremasinghe, Treasurer, FOC 2008

Flying to Sri Lanka? Speak to us first..

Exclusive to Holiday Air!

December seat sale to Colombo

ROYAL JORDANIAN £405 + tax*

Traveling out of London:
11th Dec, 16th Dec & 23rd Dec
Returning to London - 1st week in Jan
Limited seats available
Hurry, book now to avoid disappointment
Offer ends, 12th May 2008.

SriLankan £370 + tax**

**Date-Specific promotion for the month of Ma

**A Free Flight to India, Singapore or Kuala Lumpur

MCG Strong. Safe. Reliable. Mike Cooke Group

ATOL 2424 PROTECTED

IATA

020 8882 2626

www.holidayair.com

125-127 Bramley Road, Oakwood, London, N14 4UT